සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

2021 ඔක්තෝබර්18 සිට ඔක්තෝබර් 24 දක්වා සතිය

සතිය - 25

විෂය :මව්බස

ශ්‍රේණිය - 2

සැකසුම :- එම්.එම්.බී.නිශානි මිය මිය /ර/ඇඹි/හල්මිල්ලකැටිය ම.වි. 3 ශ්‍රේණිය බාර



Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School


- "දුවේ පුතේ" මෙම දෙබස ක්‍රියාකාරකමක් ලෙස කරන්න.

**දෙබස**

ළමයා : අඹ ගෙඩි පිරිලා කදිම යි
ඔබේ අඹ ගසේ
දුටුව ම අඹ කඩාගන්න
මට හිත දෙන්නේ

අඹ ගස : කඩා ගන්න හරි ම රස යි
ඉදුණු අඹ තිබේ
කාටත් මම අඹ දෙන්නෙමි
කන්නට සිත් සේ

ළමයා : ලේනුන් හා කුරුල්ලන් ද
ඇවිත් නිදහසේ
අඹ කන හැටි මම දුටුවෙමි
සතුටකි දැනුණේ

අඹ ගස : සතුන් ඇවිත් අඹ වාරෙට
ඉඳ අතු අතරේ
දුව පනිමින්, හරි සතුටිනි
මෙහි අඹ කන්නේ

ළමයා : නැති අයටත් දීම හොඳ යි
අපට තිබෙන දේ
අගය කරමි සැමදාමත්
ඔබ කරනා දේ

දෙබස ඇසුරින් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. කවි පන්තියෙන් කියවෙන්නේ කුමන ගසක් ගැන ද ?
2. මේ කවි පන්තියෙන් කියවෙන හොඳ පුරුද්දක් කියන්න.

අඹ ගස හා ළමයා අතර දෙබසක් ගොඩනගා ලියන්න.

උදා : ළමයා - ආයුබෝවන් යාළුවේ.

අඹ ගස - ආයුබෝවන් පුංචි බබෝ

ළමයා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

අඹ ගස - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

ළමයා - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

අඹ ගස - . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .